# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT

# 2013



පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය

தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சு

Ministry of Coconut Development and Janatha Estate Development

# කාර්යසාධන වාර්තාව - 2013

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය
8 වන මහල,
සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල

දුරකථන 011 - 2187075
ෆැක්ස් 011-2187071
වෙබ් අඩවිය www.cdjedmin.gov.lk



අතිගරු ජනාධිපති
මහින්ද රාජපක්ෂ මැතිතුමා



ඒ.පී. ජගත් පුෂ්පකුමාර මැතිතුමා
පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන
ගරු අමාත්‍යතුමා



බී. ඇන්තනි වික්ටර් පෙරේරා මැතිතුමා
පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා

## පටුන


පිටු අංකය

**ජයාරූප,වගු සහ සටහන් පිළිබඳ විස්තර** **6-7**

**අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර** **08**

1. අමාත්‍යාංශයේ කාර්යභාරය හා වගකීම 09
2. අමාත්‍යාංශය පිහිටුවීමේදී හඳුනාගනු ලැබූ ගැටළු සහගත තත්ත්වයන් 10
3. අමාත්‍යාංශයේ උපායමාර්ගික ප්‍රවේශය 11
4. අමාත්‍යාංශයේ ඉලක්ක 12
5. අමාත්‍යාංශයේ සංවිධාන සැලැස්ම 13
6. අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන පිළිබඳ කෙටි හැඳින්වීමක් 14
7. අමාත්‍යාංශය හා ආයතන අතර පවතින මූල්‍ය වගකීමේ හා වගවීමේ ස්වරූපය 15
8. 2013 වර්ෂයේ අත්පත් කරගත් සුවිශේෂ ජයග්‍රහණ 16-25
9. 2013 වසරේ නව සංකල්ප මත ගොඩනැගුණු වැඩසටහන් 26-35

9.1 නාගරික පොල් වගා වැඩසටහන 26

9.2 කප්රුකයි පරපුරයි 28

9.3 කප්රුක ශ්‍රම සුරැකුම 29

9.4 පොල් වගාව සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා කාබනික පෙහොර යෙදීම ප්‍රචලිත කිරීමේ හා දිරිගැන්වීමේ වැඩසටහන 30

9.5 පොල් සංස්කෘතික හා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන 31

9.6 අන්තර් ජාලගත පොල් වෙන්දේසිය 33

9.7 ගුණාත්මක නිෂ්පාදන සිදුකිරීමේ අරමුණින් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන භාවිතයන් (GMP) හඳුන්වා දීම හා ක්‍රියාත්මක කරලීම 33

9.8 පිටි කල පොල් කිරි ප්‍රවර්ධන වැඩසටහන 34

9.9 ප්‍රශස්ත මට්ටමේ ඉඩම් උපයෝගීකරණය සහ ඵලදායිතාව ඉහල නැංවීම 34

9.10 ආදර්ශ වතු සංවර්ධනය 34

10. අමාත්‍යාංශය මෙහෙයවීමෙන් අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහන් 36-43

10.1 කප්රුක පුරුවර වැඩසටහන 36

10.2 කප්රුකයි සිප්ණැනයි වැඩසටහන 37

10.3 වැලිගම රෝග මර්ධන වැඩසටහන 38

10.4 ජාලගත දත්ත පද්ධතිය 38

10.5 කප්රුක පුවත්පත් අතිරේකය 38

10.6 පොල් නව/නැවත/යටි වගා සහනාධාරය 39

10.7 දිවි නැගුම වැඩසටහන 40

10.8 පූජා භූමි පොල් වගා වැඩසටහන 40

10.9 කප්රුක ආයෝජණ ණය වැඩසටහන 40

10.10 පුනරුත්ථාපන වැඩසටහන 41

10.11 පොල් ආශ්‍රිත කර්මාන්ත ඇරඹීම/ පවත්නා කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දිම 41

10.12 පොල් කටු හා පොල් ලෙලි එක් රැස් කර කර්මාන්තයට යොමු කිරිම 42

10.13 කප්රුක නිපයුම් දිරිය සහන ණය යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරිම 43

**10.14** සාම්ප්‍රදායිකව පොල් වගා නොකරන ප්‍රදේශ වල පොල් වගාව සඳහා පාංශු යෝග්‍යතාව ඇගයීම 43

11. අමාත්‍යාංශයේ පරිපාලනය සහ ගිණුම්කරණය 44-49

11.1 අමාත්‍යාංශයේ තනතුරු හා කාර්යමණ්ඩලය 44

11.2 අමාත්‍යාංශයේ පරිපාලනය 44

11.3 අමාත්‍යාංශයේ ගිණුම්කරණය 47

11.4 2013 වර්ෂයේ පොදු ව්‍යාපාර කාරක සභා 49

11.5 අමාත්‍යාංශයේ විගණනය 49

## ඡයාරූප, වගු සහ සටහන් පිළිබඳ විස්තර

**ඡයාරූප** **පිටුව**


8.1 දැයට කිරුළ 2013 ප්‍රථම ස්ථානයට හිමි කුසලානය අතිගරු ජනාධිපතිතුමා වෙතින් ලබාගැනීම 16

8.2 2013 දැයට කිරුළ ප්‍රථම ස්ථානයට හිමි සහතිකය 16

8.3 ස්වාභාවික කෙඳි සමුළුවේ ආරම්භක අවස්ථාව 17

8.4 ගරු ඇමතිතුමා ජාත්‍යන්තර ස්වාභාවික කෙඳි සමුළුව අමතමින් 18

8.5 ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වැඩ භාර ගැනීමේ අවස්ථාව 18

8.6 ගරු අමාත්‍යතුමා සහ ලේකම්තුමා පළමු වීඩියෝ සම්මන්ත්‍රණයට සහභාගි වෙමින් 19

8.7 කප්රුක පුවත්පතෙහි පළමු සංවත්සරය සමරමින් 20

8.8 උපාධිධාරි පුහුණුවේ අවස්ථාවක් 21

8.9 කප්රුක වැඩසටහන යටතේ ගරු ඇමතිතුමා විසින් පොල් පැළ බෙදා දෙමින් 23

8.10 ගරු ඇමතිතුමා කියුබානු රාජ්‍යයේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා හමුවීම 24

8.11 ගරු ඇමතිතුමා කියාබානු රාජ්‍යයේ නිලධාරින් න සමඟ සාකච්ඡාවක 24

8.12 ගරු ඇමතිතුමා ටැන්සානියානු රාජය නිලධාරින් සමඟ සාකච්ඡාවක 25

8.13 ගරු ඇමතිතුමා ටැන්සානියා රාජ්‍ය නිලධාරින් සමඟ සිහිවටන හුවමාරු කර ගනිමින් 25

9.1 නාගරික පොල් වගා වැඩසටහන ආරම්භ කරමින් ගරු අමාත්‍යතුමා විසින් පොල් 26
පොල් පැළයක් ලබාදීමේ අවස්ථාවක්

9.2 කප්රුකයි පරපුරයි වඩසටහන ආරම්භයේදි ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා මවකට
පොල් පැළයක් ලබාදීමේ අවස්ථාවක් 28

9.3 කප්රුක ශ්‍රම සුරැකම වැඩසටහනේ ආරම්භක අවස්ථාවක් 29

9.4 කාබනික පොහොර නිෂ්පාදනය හා කාබනික පොහොර යෙදීම ප්‍රචලිත කිරීම පිලිබඳ පුහුණු 30

9.5 පාසිකුඩා සංස්කෘතික උද්‍යානයේ පිවිසුම 32

9.6 පාසිකුඩා සංස්කාතික උද්‍යානයේ නිරීක්ෂණ චාරිකාවක් සඳහා සහභාගි වු ගරු 32
ඇමතිතුමා විදේශිකයින් පිරිසක් සමඟ

10.1 ගරු ඇමතිතුමා විසින් කප්රුක පුරවරයක් ස්ථාපිත කිරිමේ අවස්ථාවක් 36

10.2 කප් රුකයි සිප්නැණයි වැඩසටහන යටතේ ගරු අමාත්‍යතුමා විසින් 6 වසර ශිෂ්‍යාවකට 37
පොල් පැළ බෙදා දෙමින්

10.3 අන්නාසි යටි වගාවක් 39

10.4 පොල් ආශ්‍රිත නිෂ්පාදන පුහුණු වැඩසටහනක අවස්ථාවක් 42

**වගු සහ සටහන්**


5.1 අමාත්‍යාංශයේ සංවිධාන සැලැස්ම 13

7.1 අමාත්‍යාංශ හා ආයතන අතර මූල්‍ය වගකීමේ සහ වගවීමේ ස්වරූපය 15

11.1 අමාත්‍යාංශයේ තනතුරු හා කාර්යමණ්ඩලය 44

11.2 බඳවාගැනීම් සහ අමාත්‍යාංශය වෙත ස්ථාන මාරුවීම් 45

11.3 අමාත්‍යාංශ නිළධාරීන් වෙනත් ආයතන වෙත ස්ථාන මාරුවීම් 46

11.4 අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා 46

# දැක්ම

ශ්‍රී ලංකාව ලෝකයේ හොඳම පොල් වගාකරුවා වීම

# මෙහෙවර

මහින්ද චින්තන හා මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව පොල් කර්මාන්තයේ ඵලදායිත්වය ලාභදායිත්වය හා තිරසාර බව වැඩි කිරීම.



# පොල් සංවර්ධන අමාත්‍යාංශය

## 01.අමාත්‍යාංශයේ කාර්යභාරය හා පැවරුනු වගකීම්

2010 නොවැම්බර් මස 22 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී.

මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන විෂයට හා අමාත්‍යාංශය යටතට පවරා ඇති,

- පොල් වගා කිරීමේ මණ්ඩලය
- පොල් සංවර්ධන අධිකාරිය
- පොල් පර්යේෂණ ආයතනය
- සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
- සීමාසහිත හලාවත වැවිලි සමාගම

යන ආයතනවල විෂයන්ට අදාල ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.

- අදාල අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකගත්වයකට පැමිණි කාල සීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.

- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යයක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.

- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යයභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමණාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම, යොදා ගනිමින් සියළුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

- බහු භෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුලින් වැවිලි ඉඩම් උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම.

- පොල් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයට අදාල කටයුතු

- පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, පොල් පර්යේෂන ආයතනය, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සහ හලාවත වැවිලි සමාගම යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් ක්‍රියාත්මක කිරීම.

- පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, පොල් පර්යේෂණ ආයතනය, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සහ හලාවත වැවිලි සමාගම යන ආයතනයන් අධීක්ෂණය කිරීම.

- පහත සඳහන් අණ පනත් පරිපාලනය කිරීම.

  - පොල් වගාකිරීමේ මණ්ඩල පනත ( 1971 අංක 46 )
  - පොල් සංවර්ධන පනත - විශේෂ විධිවිධාන පනත ( 1984 අංක 45 )
  - පොල් සංවර්ධන පනත (1971 අංක 46)
  - කොහු කෙඳි පනත ( 1967 අංක 17 )
  - පොල් නිෂ්පාදන ආඥා පනත (1935 අංක 13 )
  - පොල් පර්යේෂණ මණ්ඩල පනත (1950 අංක 37 )

  දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි ඉහත සඳහන් විෂයන්ට අදාල අනෙකුත් සියළු ව්‍යවස්ථාවන්.

## 02.අමාත්‍යාංශය පිහිටුවීමේදී හඳුනාගනු ලැබූ ගැටළු සහගත තත්ත්වයන්

පොල් වගාව හා පොල් ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රය දීර්ඝ ඉතිහාසයක් සහිතව ජාතික ආර්ථික සංවර්ධනයට ප්‍රමාණික දායකත්වයක් දැක්වුවද සුවිශේෂි වශයෙන් හඳුනාගත් ගැටළු කීපයක් පැවතුනි.

පොල් වගා ඉඩම් හෙක්ටයාරයකින් ලැබෙන සාමාන්‍ය අස්වැන්න කලාපයේ ඇතැම් රටවලට සාපේක්ෂව පහළ අගයක් ගත් අතර එය තනි භෝගයක් ලෙස වගාකිරීම ආර්ථික වශයෙන් එතරම් ඵලදායී නොවුනි. පොල් වගාව ආශ්‍රිතව අතුරු භෝග වගාව සැලකිය යුතු පරිමාණයකින් සිදු කෙරුනද එම නිශ්පාදන සඳහා නිසි වෙළඳපොලක් නොලැබුනි. එමෙන්ම අතුරුභෝග වගාව කෙරෙහි ගොවීන් යම් ප්‍රතිරෝධයක් දැක්වීමද කැපී පෙනිනි. ප්‍රාග්ධන ඌනතාවය වගා බිම්වලට අවශ්‍ය තරම් පොහොර නොලැබීම මේ කෙරෙහි බලපා තිබුණි. කුඩා පොල් වතු හිමියන්ගේ ව්‍යවසායකත්වය පහළ මට්ටමක පැවතීම මත නිසි වතු කළමනාකරණයක් සිදු නොවූ අතර නිෂ්පාදන අලෙවි ප්‍රශ්නාද පහල මට්ටටමක රැඳී තිබුණි.

පොල් ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයද දීර්ඝකාලීනව ඒකාකාරී ස්වභාවයක් ගත් අතර නිෂ්පාදන විවිධාංගීකරණයට සහ නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ කුසලතාවයද අඩු මට්ටමක පැවතුනි. ශක්තිමත් ලෙස තහවුරු කරන ලද ප්‍රජාමූල සංවිධානයන් නොතිබීම නිසා කර්මාන්ත ක්ෂේත්‍රය පැවතියේ විසිරුණු ස්වභාවයකින්ය. එසේම අපනයන ඉල්ලුම වර්ධනය කර ගැනීමේ විශාල විභවතාවයක් පැවති බැවින් එයට උචිත ලෙස පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනය දිශාගත කිරීමද කාලීන අවශ්‍යතාවයක් වී තිබුණි.

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය කැබිනට් අමාත්‍යාංශයක් ලෙස වෙනම ස්ථාපිත කිරීම කෙරෙහි ඉහත කී ශක්‍යතාවයද බලපාන ලදී.

## 03.අමාත්‍යාංශයේ උපාය මාර්ගික ප්‍රවේශය

මෙම තත්ත්වය පිටුදැකීම සඳහා අමාත්‍යාංශය මූලික උපායමාර්ග කීපයක් හඳුනාගනු ලැබීය.

පොල් නිෂ්පාදනය ජාතික අවශ්‍යතාවයට ගැලපෙන සේ වර්ධනය කිරීම සඳහා පොල් වගාව විශාල වශයෙන් ව්‍යාප්ත කිරීමත් දැනට පවතින පොල් ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ඒවායේ පාංශු සරුබව වැඩිකිරීමත් කළ යුතු විය.

නියඟයට හා රෝගවලට ඔරොත්තු දෙන ඉහළ අස්වැන්නක් ලබාගත හැකි නව ප්‍රභේද යලි වගා කිරීමත් වගා ඉඩම්වල පාළු සිටුවීමත් හඳුනාගත් තවත් උපායමාර්ගයක් වේ.

පොල් වගාව තනි භෝගයක් ලෙස පවතිනවාට වඩා එහි අතුරුභෝග හා සත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම ආර්ථික වශයෙන් වඩා ඵලදායී බැවින් එය ගොවීන් අතර ප්‍රචලිත කිරීමද තවත් වැදගත් උපායමාර්ගයක් ලෙස හඳුනා ගන්නා ලදී.

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කප්රුක පුරවර වැඩසටහන ඉතා වැදගත් උපායමාර්ගයක් ලෙස හඳුනාගත් අතර කප්රුක සමිති මගින් වගා ක්ෂේත්‍රයට මෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට විශාල වැඩසටහන් දියත් කිරීමට සැලසුම් කෙරිනි.

කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවා නියුක්තිකයන්ගේ සුරක්ෂිතතාවය මෙන්ම රැකියාවේ අභිමානයද ඉහළ තත්ත්වයට නංවාලීම සඳහා දිගුකාලීන රක්ෂණ ක්‍රමයක් නිර්මාණය කිරීම ද නව උපායමාර්ගික ප්‍රවේශයක් වේ.

අපනයන ආදායම් ඉහළ නැංවීම මගින් ජාතික ආර්ථික සංවර්ධනයට මෙම ක්ෂේත්‍රයෙන් ලබාදියහැකි විභව දායකත්වය ඉතා ඉහළ අගයක් ගනී. ඒ සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය යෙදවුම් වන ගෙඩි පොල් සඳහා පවතින ගෘහස්ථ මට්ටමේ පරිභෝජනය අවම කර ඒ වෙනුවට ආදේශකයක් ලෙස පිටිකල පොල් කිරි හා පොල් ක්‍රීම් ආදී නිෂ්පාදන පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමද තවත් උපායමාර්ගයකි. එමගින් 70% ක් තරම් වන ගෘහස්ථ මට්ටමේ ගෙඩි පොල් පරිභෝජනය හැකිතාක් අවම කිරීමට ඉලක්ක කෙරේ.

## 04. අමාත්‍යාංශයේ ඉලක්ක

ඉහතින් සඳහන් උපායමාර්ග තුළ හඳුනාගනු ලැබූ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කෙරෙන අතර එහිදී ලඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක මෙසේය.

- රටෙහි ආහාරමය හා කර්මාන්ත ඉල්ලුම සපුරාලීම සඳහා ඉදිරි සය වසර (2011-2016) තුළදී පවත්නා පොල් වගා ඉඩම්වල පොල් නිෂ්පාදනය වසරකට ගෙඩි මිලියන 3650 ක් දක්වා වැඩි කිරීම.

- පොල් පරිභෝජනය කරන්නන්ගේ හා සැකසුම්කරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන ලෙස ගෙඩි ඵලදාවේ තිරසාරභාවය තහවුරු කිරීම සඳහා පොල් ගස් ප්‍රමාණය වැඩි කිරීම

- පොල් වගා සහ සුළු හා මධ්‍ය පරිමාණ පොල් ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි යොමු කරනු වස් කුඩා ඉඩම් හිමියන් ප්‍රජාමූල සංවිධාන ලෙස සංවිධාන ගතකර ඔවුන් සඳහා රැකියා අවස්ථා ජනිත කර දිළිඳුකම පිටු දැකීම

- සත්ත්ව පාලන /අතුරු බෝග විවිධාංගීකරණය හරහා පොල් ඉඩම්වල ඵලදායිත්වය හා ගොවිපළ ආදායම වැඩි කිරීම .

- පරිසර හිතකාමී සහ ආර්ථික වශයෙන් ඵලදායීවන පොල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

- විදේශ විනිමය උපයා ගැනීම වැඩි කිරීම සඳහා ලෝක වෙළඳපොළෙහි තරඟකාරිත්වයට මුහුණ දීමට හැකිවන පරිදි පොල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

- පොල් කර්මාන්තයෙහි වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා නව තාක්ෂණ ක්‍රම උත්පාදනය සහ පවත්නා තාක්ෂණය වැඩි දියුණු කිරීම.

- පොල් ආශ්‍රිත කර්මාන්තවල විධිමත් හා අවිධිමත් අංශ විවිධාංගීකරණය කිරීමෙන් ආදායම් උත්පාදනය ඉහළ නැංවීම

# 05. අමාත්‍යාංශයේ සංවිධාන සැලැස්ම




අති.- අතිරේක

සැ.- සැලසුම්

ස- සහකාර

ස.සැ- සහකාර සැලසුම්

ක.ස-කළමණාකරන සහකාර

කා.කා.ස- කාර්යාල කාර්ය සහායක

**5.1** අමාත්‍යාංශයේ සංවිධාන සැලැස්ම

## 6. පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන පිලිබඳ කෙටි හැඳින්වීමක්

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතට අනුබද්ධ ආයතන පහක් 2010 නොවැම්බර් මස 22 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පවරා තිබේ.

### <u>6.1 පොල් සංවර්ධන අධිකාරිය (පො.ස.අ)</u>

1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතින් සංස්ථාපිත පොල් සංවර්ධන අධිකාරිය පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ නෛතික හා නියාමන කටයුතු සම්බන්ධයෙන් බලය පැවරුණු ආයතනය වේ. පොල් කර්මාන්ත ක්ෂේත්‍රය නියාමනය කිරීම, රෙගුලාසි පැනවීම, අධීක්ෂණය, තාක්ෂණය සැපයීම සහ කර්මාන්තයේ සංවර්ධනයට අදාළ මැදිහත්කරුවකු ලෙසද එය ක්‍රියා කරයි.

### <u>6.2 පොල් වගා කිරීමේ මණ්ඩලය (පො.ව.ම)</u>

ඉහත සඳහන් 1971 පොල් සංවර්ධන පනතේ රෙගුලාසි මගින් සංස්ථාපිත පොල් වගා කිරිමේ මණ්ඩලයේ ප්‍රධානතම අරමුණ වන්නේ දිවයිනේ පොල් වගාකරුවන් සඳහා කාර්යක්ෂම ව්‍යාප්ති සේවයක් සහ උපදෙස් සැපයීම මගින් පොල් නිෂ්පාදනය හා ඵලදායිත්වය වැඩි කිරීම හා තිරසාර පොල් වගාවන් ස්ථාපනය කිරීමයි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පොල් වගා කරුවන් වෙත අවශ්‍ය යෙදවුම් සහ මූල්‍ය ආධාර සැපයීම මෙමගින් සිදු වන ප්‍රධාන කාර්යය වේ. දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල දහඅට (18) ක් මගින් එම ව්‍යාප්ති සේවාව ක්‍රියාත්මක කෙරේ.

### <u>6.3 පොල් පර්යේෂණ ආයතනය (පො.ප.ආ)</u>

1929 වර්ෂයේ ආරම්භ කරන ලද පොල පර්යේෂණ ආයතනය ඉහත සඳහන් පනත මගින් පොල් පර්යේෂණ මණ්ඩලය ලෙස සංස්ථාපනය කර ඇත. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණ සිදු කිරීම මගින් නව තාක්ෂණික ක්‍රමවේද සංවර්ධනය කිරීම මගින් පොල් වගාවේ නිෂ්පාදනය ඉහළ නැංවීමයි. නව පොල් ප්‍රභේද හඳුන්වා දීම මගින් භෝග ආරක්ෂණය තහවුරු කිරීමත්, සැකසුම් ක්ෂේත්‍රයට අදාලව පොල් ආශ්‍රිත නිෂ්පාදන වල අගය එකතු කිරීම සහ නව නිෂ්පාදනයන් බිහි කිරීමත් මෙයින් සිදුවන ප්‍රධාන කාර්යයකි.

### <u>6.4 සීමාසහිත හලාවත වැවිලි සමාගම (හ.වැ.ස)</u>

රාජ්‍ය සමාගමක් වන සීමාසහිත හලාවත වැවිලි සමාගම 1992 ජුනි මස 18 වන දින නීතිගත කළ සමාගමකි. මෙම සමාගම වගාව, නිෂ්පාදනය හා සැකසුම් ආශ්‍රිත කෘෂි නිෂ්පාදන ක්‍රියාදාමයන් විවිධාංගිකරණය, පොල් අලෙවිය සහ අතුරු බෝග වගාවෙහි යෙදී සිටී.

### <u>6.5 සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම (කු.වැ.ස)</u>

රාජ්‍ය සමාගමක් වන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1992 ජුනි මස 22 වන දින නීතිගත කළ සමාගමකි. මෙම සමාගම වගාව, නිෂ්පාදනය සහ සැකසුම් ආශ්‍රිත කෘෂි නිෂ්පාදන ක්‍රියාදාමයන් විවිධාංගිකරණය, පොල් හා රබර් අලෙවිය සහ අතුරු බෝග වගාවෙහි යෙදී සිටී.

2013 වර්ෂයේදි කෘෂි ව්‍යාපාර සම්මාන උළලෙදි මහ පරිමාණ කෘෂි ව්‍යවසායන් සහ කෘෂි ව්‍යාපාරික ක්ෂේත්‍රයේ කටයුතු කරන බහුජාතික සමාගම් අභිබවා **සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සමස්ථ ලංකා ප්‍රථම ස්ථානයට හිමි රන් සම්මානය සහ මහ පරිමාණ නිෂ්පාදක (වැවිලි අංශය) රන් සම්මානයද දිනා ගැනීමට සමත් වි ඇත.**

## 7. අමාත්‍යාංශය හා ආයතන අතර පවතින මූල්‍ය වගකීමේ හා වගවීමේ ස්වරූපය




**7.1** අමාත්‍යාංශ හා ආයතන අතර මූල්‍ය වගකීමේ සහ වගවීමේ ස්වරූපය

## 8. 2013 වර්ෂයේ අමාත්‍යාංශය අත්පත් කරගත් සුවිශේෂී ජයග්‍රහණ

මහින්ද චින්තනය සහ මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රකාශයන්ට අනුකූලව පොල් වගා හා කර්මාන්ත ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇතිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් නිර්මාණය කරමින් ඒවා ක්‍රියාත්මක කිරීම සහ අනුබද්ධ ආයතන ප්‍රශස්ථ ලෙස එම අරමුණු කරා මෙහෙයවමින් 2013 වර්ෂයයේදී අමාත්‍යාංශයෙන් අපේක්ෂිත කාර්යභාරය විශිෂ්ය ලෙස ඉටු කිරීමට සමත් වී තිබේ. අමාත්‍යාංශය ස්ථාපිත කොට වසර තුනක් වැනි කෙටිකාලයක් තුළ ඉහත නිර්මාණශීලී මෙන්ම නව සංකල්ප ඔස්සේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

**අමාත්‍යාංශය සෙත්සිරිපාය වෙත ගෙන යයි.**

මෙතෙක් ටී.බී ජයා මාවතේ පිහිටි පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය අංග සම්පූර්ණ පහසුකම් සහිතව බත්තරමුල්ල සෙත්සිරිපාය දෙවන අදියරයේ නව ගොඩනැගිල්ල වෙත ගෙන යාමට හැකිවිය.

**2013 දැයට කිරුළ ප්‍රදර්ශනය**

2013 වර්ෂයේදී පවත්වන ලද හත්වන වන දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා අමාත්‍යාංශය එහි අනුබද්ධ ආයතනද සමඟ ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද පරිසරහිතකාමී කුටිය සමස්ථ ප්‍රදර්ශනයෙන් හොඳම කුටියට හිමි සම පළමුවන ස්ථානය දිනා ගන්නා ලදි.



8.1 දැයට කිරුළ 2013 ප්‍රථම ස්ථානයට හිමි කුසලානය අතිගරු ජනාධිපතිතුමා වෙතින් ලබාගැනීම




8.2 2013 දැයට කිරුළ ප්‍රථමස්ථානයට හිමි සහතිකය

## ස්වාභාවික කෙඳි පිළිබඳ ජාත්‍යන්තර සමුළුව පැවැත්වීම

ලෝකයේ ස්වභාවික කෙඳි කර්මාන්තයේ නියැලෙන රටවල් අතර සහයෝගීතාව වර්ධනය කිරීම, ස්වභාවික කෙඳි සඳහා ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවර්ධනය හා ස්වභාවික කෙඳි කර්මාන්තය සඳහා ජාත්‍යන්තර ප්‍රතිපත්ති පිහිටුවීම, සංශෝධනය කිරීම හා ක්‍රමෝපායන් සකස් කිරීම අරමුණින් 39 වන “ස්වභාවික කෙඳි පිළිබඳ ජාත්‍යන්තර සමුළුව” හා 37 වන “අන්තර්ජාතික ස්වාභාවික දෘඪ කෙඳි පිළිබඳ ජාත්‍යන්තර සමුළුව” මෙම අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් 2013 නොවැම්බර් 04 – 07 දක්වා ශ්‍රී ලංකාවේදී පැවැත් වුණි.

එහිදී ඉදිරි වසර දෙකක කාලය සඳහා මෙම අන්තර්ජාතික සංවිධානයේ සභාපතීත්වය ශ්‍රී ලංකාවට හිමි විය.




**8.3** ජාත්‍යන්තර කෙඳි සමුළුවේ ආරම්භක සැසිය




**8.4** ගරු ඇමතිතුමා ආරම්භක සැසිය අමතමින්

## නව නියෝජ්‍ය අමාත්‍යවරයා ගේ පත්වීම

පුත්තලම් දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී බී. ඇන්තනි වික්ටර් පෙරේරා මැතිතුමා 2013.10.11 දින පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස දිවුරුම් දෙනු ලැබීය.



**8.5** ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වැඩ භාර ගැනීමේ අවස්ථාව

## වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමවේදය ආරම්භ කිරීම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් අනුබද්ධ ආයතනවල වියදම් හා කාල කළමණාකරණය සිදුකර ආයතනවල ඵලදායිතාවය වර්ධනය අරමුණු කොටගෙන අමාත්‍යාංශයේදී පැවැත්වෙන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් හා වෙනත් රැස්වීම් පැවැත්වීමට Skype තාක්ෂණය ඔස්සේ වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමවේදය යොදා ගනු ලබන අතර මේ යටතේ පළමු ප්‍රගති සමාලෝචන රැස්වීම 2013.10.07 වන දින පවත්වන ලදි.මෙම ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස එක් රැස්වීම් වාරයක් සඳහා එක් ආයතනයකට රු.10000.00 ක පමණ මූල්‍ය ඉතිරියක් සිදු කිරීමට හැකියාව ලැබී ඇත.





**8.6** ගරු අමාත්‍යතුමා සහ ලේකම්තුමා පළමු වීඩියෝ සම්මන්ත්‍රණයට සහභාගී වෙමින්

## කප්රුක පුවත්පත් අතිරේකය අඛණ්ඩව ප්‍රකාශනයට පත් කිරිම

පොල් ප්‍රජාව වෙත ව්‍යාප්ති හා කර්මාන්ත තොරතුරු මෙන්ම ක්ෂේත්‍රෙය් නව ප්‍රවණතා පිළිබඳ තොරතුරු ලබාදෙමින් පොල් ප්‍රජාව හා අමාත්‍යාංශය අතර සන්නිවේදන මාධ්‍යක් ලෙස අමාත්‍යාශයේ නිල පුවත්පත වන “කප්රුක”පුවත්පත 2012 ඔක්තෝබර් මස සිට අඛණ්ඩව දිණමිණ , තිණකරන් හා ඩේලි නිවුස් පුවත්පත් සමඟ සෑම මසකම දෙවන සිකුරාදා දින ප්‍රකාශයට පත් කරනු ලැබීය.



**8.7** කප්රුක පුවත්පතෙහි පළමු සංවත්සරය සමරමින්

## පොල් ආශ්‍රිත කාර්මාන්ත ප්‍රමිතිගත කිරිම

පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ප්‍රමිතිගත කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ ඒකාබද්ධව යහපත් නිෂ්පාදන භාවිතයන් (GMP)දිසිදි පොල් කර්මාන්තශාලා සඳහා 2013 දී හඳුන්වා දුන් අතර ඒ සඳහා ඉතා යහපත් ප්‍රතිචාරයක් කර්මාන්තකරුවන් වෙතින් ලැබී ඇත. ඒ අනුව පොල් තෙල් හා කොහු කර්මාන්ත සඳහාද 2014 දී මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

වාර්ෂික වාර්තා 27 ක් කැබිනට් මණ්ඩලයට

2010 වසරේදී අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු වසර කිහිපයක සිට ප්‍රමාද වෙමින් පැවති අමාත්‍යාංශයට අයත් අනුබද්ධ ආයතනයන්හි වාර්ෂික වාර්තා 27 ක් 2013 අගෝස්තු මාසය වන විට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට හැකිවිය.

උපාධිධාරි අභ්‍යාසලාභීන් සඳහා පුහුණු වැඩසටහනක්

රාජ්‍ය සේවයට එක්වූ නවක උපාධිධාරි අභ්‍යාසලාභීන්ගේ හා සංවර්ධන නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය අරමුණු කර ගනිමින් ගරු ඇමතිතුමාගේ සංකල්පයක් මත 250 ක කණ්ඩායමකට තෙදින නේවාසික පුහුණු වැඩසටහනක් අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පැවැත්වීමට හැකි විය.



**8.8** උපාධිධාරි පුහුණුවේ අවස්ථාවක්



**වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පාලනය කිරීම**

දකුණු පළාතේ පැතිරී යන පොල් කොළ මැළවීමේ රෝගය මර්ධනය හා පාලනය සඳහා රෝගී ගස් ඉවත් කර ඉඩම් හිමියන්ට වන්දි ගෙවීම් සිදු කරමින් පවතින අතර මේ වන විට රෝගය රෝගී ප්‍රදේශයෙන් වෙනත් ප්‍රදේශ වලට පැතිරීම පාලනය කර ඇත.

**ජාලගත මෙහෙයුම් කළමණාකරණ පද්ධතිය සාර්ථකයි.**

2012 වසරේ හඳුන්වා දුන් අමාත්‍යාංශයට අයත් අනුබද්ධ ආයතනයන්හි පොල් වතු කළමණාකරණය සඳහා වූ ජාල ගත කළමණාකරණ මෙහෙයුම් පද්ධතිය සාර්ථකව තවදුරටත් ක්‍රියාත්මක වේ. මේ තුළින් අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතතනයන්හි පොල් වතු වල සේවක පැමිණීම දිනපතා පෙ.ව 10 වන විටද පොල් වතු වලින් දෛනිකව ලැබෙන පොල් අස්වැන්න දිනපතා ප.ව. 5 පමණ වන විටද ගරු ඇමතිතුමා , ලේකම්තුමා හා වෙනත් නිලධාරීන්ගේ ජංගම දුරකථන වෙත කෙටි පණිවුඩ මගින් ලැබීම සිදුවේ. එමඟින් අමාත්‍යාංශය විෂය පථය යටතට ගැනෙන සියළුම පොල් වල දෛනික අස්වැන්න සහ සේවක පාලනය මනාව නියාමනය කිරීමට හැකි විය.

## කප්රුක පුරවර වැඩසටහන තවදුරටත් ඉදිරියට

පොල් වගා කිරීම හා සුළු හා මධ්‍ය පරිමාණ පොල් ආශ්‍රිත කර්මාන්ත වෙත ප්‍රජාව යොමු කිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් හා ප්‍රජා මූල සංවිධාන ලෙස ඔවුන් සංවිධාන ගත කර ඒ තුළින් පොල් ගස පාදක කරගත් රැකියා අවස්ථා උත්පාදනය කර දිළිඳුභාවය පිටු දැකීම අරමුණු කර ගනිමින් ආරම්භ කරන ලද“**කප්රුක පුරවර** ” වැඩසටහන යටතේ 2013-12-31 දින  දක්වා කප්රුක පුරවර 133 ක්ද ප්‍රාථමික සමිති 5319 ක්ද ස්ථාපිත කර ඇත. මෙය 2016 දක්වා වන ඉලක්කයෙන් 73% ක් සහ 63% කි.




**8.9** කප්රුක වැඩසටහන යටතේ ගරු ඇමතිතුමා විසින් පොල් පැළ බෙදා දෙමින්



## කියුබාව සමඟ තාක්ෂණික හුවමාරුව හා පුහුණුවීම්

අතිගරු ජනාධිපතිතුමන් 2012 වර්ෂයේදී කියුබාවේ සිදු කළ සංචාරයේදී ඇති කරගත් ද්විපාර්ශවික අවබෝධතා ගිවිසුම යටතේ පොල් ක්ෂේත්‍රයේ සංවර්ධනය පිළිබඳ වූ එකඟතා සමාලෝචනය කිරීම සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා ඇතුළු දූත පිරිසක් 2013 ජූනි මස සංචාරය කරනු ලැබීය. මෙහිදී පොල් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා තාක්ෂණික හුවමාරුව හා පුහුණුවීම් සම්බන්ධව දෙපාර්ශවය අතර එකඟතාවයන් ඇති කර ගන්නා ලදී.



**8.10** ගරු ඇමතිතුමා කියුබානු රාජ්‍යයේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා හමුවීම



**8.11** ගරු ඇමතිතුමා කියාබානු රාජ්‍යයේ නිලධාරින් සමඟ සාකච්ඡාවක

## ටැන්සානියාවේ රෝග හා කෘමි උවදුර මර්ධනය සඳහා ශ්‍රී ලංකාවෙන් දැනුම

අතිගරුජනාධිපතිතුමන් 2013 ජුනි මාසයේදී ටැන්සානියාවේ සිදු කළ සංචාරයේදී ඇති කරගත් ද්විපාර්ශවික අවබෝධතා ගිවිසුම යටතේපොල් ක්ෂේත්‍රයේ සංවර්ධනය පිළිබඳවූ එකඟතා සමාලෝචනය කිරීම සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා ඇතුළු දූත පිරිසක් 2013 ඔක්තොබර් මාසයේදී සංචාරය කරනු ලැබීය. මෙහිදී ටැන්සානියාවේ රෝග හා කෘමි උවදුරු මර්දනය සඳහා ශ්‍රී ලංකාවෙන් දැනුම ලබා දීමට එකඟතාවයන්ට එළඹෙන ලදී.




**8.12** ගරු ඇමතිතුමා ටැන්සානියානු රාජ්‍ය නිලධාරින් සමඟ සාකාච්ඡාවක



**8.13** ගරු ඇමතිතුමා ටැන්සානියා රාජ්‍ය නිලධාරින් සමඟ සිහිවටන හුවමාරු කර ගනිමින්

# 9. 2013 වසරේ නව සංකල්ප මත ගොඩනැගුනු නව වැඩසටහන්

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍ය ඒ.පී.ජගත් පුෂ්පකුමාර මැතුතුමා විසින් හදුන්වා දුන් නව සංකල්ප ගණනාවක් මත නිර්මාණය කරන ලද ඉතා ඵලදායී වැඩසටහන් ගණනාවක් එතුමාගේ මගපෙන්වීම හා නායකත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයට හැකිවිය. එහිදී අනුබද්ධ ආයතන ඉතා ප්‍රශස්ථ ලෙස මෙහෙයවමින් අදාළ අරමුණු ජය ගැනීමට අමාත්‍යාංශයට හැකිවිය.

## 9.1 නාගරික පොල් වගා වැඩසටහන



**9.1** නාගරික පොල් වගා වැඩසටහන ආරම්භ කරමින් ගරු අමාත්‍යතුමා විසින් පොල් පැළයක් ලබාදිමේ අවස්ථාවක්

නාගරික නිවාස යෝජනාක්‍රමවල ජීවත්වන නගරවාසීන්ට ස්වකීය පරිභෝජනය සඳහා අනිවාර්යයෙන්ම පොල් මිලට ගැනීමට සිදුවේ. ඔවුන් සතු සීමිත බිම් කොටස ප්‍රශස්ත ලෙස උපයෝජනය කරමින් ආර්ථික වශයෙන් සවියක් ලබාදීමද අරමුණු කරමින් නව දෙමුහුන් පොල් ප්‍රභේදයක් නාගරික නිවාස යෝජනා ක්‍රමයක් සඳහා හදුන්වා දෙනු ලැබීය. එක් නිවසකට

දෙමුහුන් පොල් පැළ දෙක බැගින් ලබා දෙන අතර වසර 04 ක කාලයක් තුල ගස පීදී එල දරණ බැවින් සහ එතරම් උස් නොවූ විශේෂයක ශාඛ බැවින් එමගින් නාගරික ජනතාවට ඉතා පහසුවෙන් පොල් ලබා ගත හැකි නව අත්දැකීමක් ලැබෙනු ඇත.

නාගරික ජනගහනය ඉතා විශාල බැවින් ඔවුන් විසින් ගෘහස්ථ පරිභෝජනය සඳහා වෙළඳපොලෙන් පොල් මිලට ගැනීම මෙමගින් අවම වන බැවින් එම කොටස කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලෙස උපයෝගී කර ගත හැකිවේ.දීර්සකාලීන වශයෙන් කර්මාන්ත සඳහා තිරසාර අමුද්‍රව්‍ය සැපයීම තහවුරු කිරීමටත් අපනයන ආදායම ඉහළනංවා ගැනීමටත් සුවිශේෂව වැදගත් වේ.

මෙහි ආරම්භක වැඩසටහන 2013 දෙසැම්බර් මස 21 වන දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගරසභාව සමග ඒකාබද්ධව ආරම්භ කරන ලදී. මේ යටතේ මේ දක්වා බෙදා හැර ඇති පොල් පැළ සංඛ්‍යාව 1000 ක් වන අතර නාගරික නිවාස යෝජනා ක්‍රම ගණනාවක් ඉලක්ක කර ගනිමින් ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන ඉදිරියේදි මහරගම, කැස්බෑව, මොරටුව, කොළඹ, සීතාවක, පාදුක්ක, හෝමාගම, කඩුවෙල හා කොළොන්නාව යන ප්‍රදේශයන්හිද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඉහත කී අරමුණු සාර්ථක කර ගැනීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය ප්‍රශස්ථ ලෙස මෙහෙයවීමට අමාත්‍යාංශයට හැකිවිය.

## 9.2කප්රුකයි -පරපුරයි



**9.2** කප්රුකයි පරපුරයි වැඩසටහන ආරම්භයේදි ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා මවකට පොල් පැළයක් ලබාදීයේ අවස්ථාවක්

තුරුලතා ශාඛ හා පරිසරය මිනිසාගේ ජීවිතය හා අවියෝජනීය ලෙස බැඳී ඇත.උපත ලබන සෑම මිනිසෙක්ම පරිසරය සුරැකීමේ වගකීමට උරදී සිටී. ඒ අර්ථයෙන් උපත ලබන සෑම දරුවෙකුටම තම ළමාකාලය සමග බද්ධව වැඩෙන ලෙස පොල් පැළ දෙකක් ලබා දීමෙන් පොල් පැළය හා එයට සමගාමීව පරිසරය කෙරෙහි ඇළුම් කරන මිනිසෙකු නිර්මාණය කළ හැකිය. පොල් ගස එලදරණ වයස අවු.5 දී දරුවා පාසලට ඇතුළුවන විට එහි අස්වැන්න ඔහුගේ අධ්‍යාපනය හා අනාගතය තිරසාර බවට දායක වෙයි. එය ළමයා සමග වැඩේ. එනයින් පොල් ගස පරපුරක උරුමයකි.

මෙම වැඩසටහන් යටතේ දිවයින පුරා මවුවරුන් සඳහා පොල් පැළ 1427 ක් ලබා දී ඇත. මෙම කාර්යයේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන් ග්‍රාමීය මට්ටමේදී දරුවාගේ වර්ධනය සේම පොල් පැළයේ වර්ධනයද පරීක්ෂා කරනු ලැබේ. පොල් පැළයේ වර්ධනය පිළිබඳ සටහන් තැබීමට පත්‍රිකාවක්ද සැපයේ. මෙම වැඩසටහන මගින් ප්‍රජාව තුළ නව

උද්යෝගයක් ඇති කිරීමට අමාත්‍යාංශය සමත් විය. මෙම වැඩසටහන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය දැක්වූ දායකත්වය ඉතා ප්‍රශංසනීය බවද සටහන් කරමු.

## 9.3 කප්රුක ශ්‍රම සුරැකුම.



**9.3** කප්රුක ශ්‍රම සුරැකම වැඩසටහනේ ආරම්භක අවස්ථාවක්

පොල් වගා හා කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවා නියුක්ත දහස් ගණනක් කම්කරුවන්ගේ ජීවිතවලට පවතින අවධානම ඔවුන් ලෙඩරෝග වැළඳුනු අවස්ථාවලදී මුහුණපෑමට සිදුවන මූල්‍ය දුෂ්කරතා හා රැකියාවේ සමාජ පිළිගැනීම අඩුකම සැලකිල්ලට ගෙන එම තත්ත්වයන් පිටුදැකීම සඳහා ආරම්භ කළ නව වැඩසටහනකි. පොල් ක්ෂේත්‍රයේ සේවා නියුක්ත කම්කරුවන් ඉලක්ක ගත කර ගනිමින් ක්‍රියාත්මක කළ මෙම රක්ෂණ වැඩසටහන ශ්‍රී ලංකා රක්ෂණ ස්ස්ථාව සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුමක් මත ක්‍රියාත්මක වේ.

පොල් වගා කිරීමේ මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් සහ කප්රුක සමිති මගින් ක්‍රියාත්මක කෙරෙන මෙම රක්ෂණ වැඩසටහන මගින් කම්කරුවන්ගේ සමාජ පිළිගැනීම ඉහළ මට්ටමක නංවාලීමට හැකිවන අතර ඔවුන් වෙත සුරක්ෂිත බවද තහවුරු කෙරේ.

මෙම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වන අවධානම අවම කිරීමට අමතරව, පොල් ආශ්‍රිත රැකියා වල යෙදෙන්නන්ගේ

- ගරුත්වය, සමාජයේ පිළිගැනීම හා වටිනාකම ඉහළ දැමීම
- ආපදා අවස්ථා වලදී ආර්ථික ස්ථාවරත්වයක් ලබාදීම
- ආත්ම විශ්වාසය ගොඩනැගීම
- වයස්ගත වූ පසු ජීවන තත්ත්වය පවත්වාගෙන යාම සඳහා ස්ථිර ආදායම් තත්ත්වයක් ඇති කිරීම.

**කප්රුක ශ්‍රම සුරැකුම වැඩසටහන යටතේ ආවරණය වන ක්ෂේත්‍ර,**

- පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනවල වතු හා කර්මාන්ත ශලා
- වෙනත් රාජ්‍ය ආයතනවලට අයත් පොල් වතු හා පොල් ආශ්‍රිත කාර්මාන්ත ශාලා
- පෞද්ගලික වතු හිමියන් යටතේ පොල් වතු වල රැකියාවෙහි යෙදෙන්නන්
- පෞද්ගලික කාර්මාන්ත ශාලාවන්හි පොල් ආශ්‍රිත රැකියාවල යෙදෙන පුද්ගලයන්

## 9.4 පොල් වගාව සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා කාබනික පෙහොර යෙදීම ප්‍රචලිත කිරීමේ හා දිරිගැන්වීමේ වැඩසටහන



**9.4** කාබනික පොහොර නිෂ්පාදනය හා කාබනික පොහොර යෙදීම ප්‍රචලිත කිරීම පිලිබඳ පුහුණු වැඩසටහනක අවස්ථාවක්

රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීමේ ප්‍රයත්නයන් රට පුරා ක්‍රියාත්මක වන අතරතුර පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයද එම ජාතික මෙහෙවරට දායක වීමේ අරමුණින් පොල් වගාව සඳහා කාබනික පොහොර භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම අරමුන ලඟාකර ගැනීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය සාර්ථක ලෙස මෙහෙයවීමට අමාත්‍යාංශයට හැකිවිය.

මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වන්නේ පොල් ඉඩම් වල පසෙහි සාරවත් බව වැඩිදියුණු කිරීම සඳහා දේශිය වශයෙන් ස්වභාවිකව ලබාගත හැකි ලාභදායි ද්‍රව්‍ය කාබනික පොහොර ලෙස භාවිතා කිරීමටත්, ඉවතලන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරමින් කාබනික පොහොර සාදා ගැනීමටත්, කාබනික පොහොර භාවිතා කිරිම සඳහා වගාකරුවන් උනන්දු කරවීමත් වේ. රසායනික පොහොර ආනයනය සඳහා වැයවන විදේශ විනිමය අවම කිරීමද මෙම වැඩසටහනහි එක් අපේක්ෂාවකි.

ප්‍රධාන කණ්ඩායම් තුනක් ඉලක්ක කරගනිමින් ක්‍රමවේද තුනක් ඔස්සේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

- කප්රුක සමිති හෝ සමිති සාමාජිකයන් මඟින් කාබනික පොහොර නිෂ්පාදනය කරන්නන්
- කාබනික පොහොර සමඟ අකාබනික පොහොර අනුපූරකයක් ලෙස භාවිතා කරන පොල් වගාකරුවන්
- විශේෂ සහතික පත්‍ර හිමි කාබනික පොල් වගාකරුවන්

## 9.5 පොල් සංස්කෘතික හා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන

දශක තුනක ත්‍රස්තවාදය නිමා කිරීමත් සමඟ ශ්‍රී ලංකාව සංචාරක පාරාදීසයක් බවට පත්වීමේ විභවතාවය හඳුනාගනිමින් ජාතික කර්තව්‍යකට උරදිමක් වශයෙන් ගරු අමාත්‍යතුමාගේ සංකල්පනාවක් මත පොල් සංස්කෘතික හා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන ආරම්භ කරන ලදී.
මේ යටතේ ඉදිකෙරෙමින් පවතින පාසිකුඩා පොල් සංස්කෘතික උද්‍යානයෙහි පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රදර්ශනාත්මකව සිදු කරමින් විදේශිය සංචාරකයින් දැනුවත් කිරිමට හා ආකර්ශනය කිරීමට බලාපොරොත්තු වේ. එමෙන්ම මේ සඳහා එම ප්‍රදේශයේම පවතින පොල් හා පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය භාවිතය දිරි ගන්වමින් එම ප්‍රදේශයේම කරමාන්තකරුවන් බිහිකිරිමත්, ඔවුන්ට ආධාර ලබාදිමත් මගින් රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරිමද අපේක්ෂා කෙරේ.




**9.5** පාසිකුඩා පොල් සංස්කෘතික උද්‍යානයේ පිවිසුම



**9.6** පාසිකුඩා පොල් සංස්කෘතික උද්‍යානයේ නිරීක්ෂණ චාරිකාවක් සඳහා සහභාගී වූ ගරු ඇමතිතුමා විදේශිකයින් පිරිසක් සමඟ

## 9.6 අන්තර් ජාලගත පොල් වෙන්දේසිය

ලංකාව පුරා ව්‍යාප්ත වී ඇති පොල් වගාකරුවන් වෙත සාධාරණ මිලක් ලබාදීමට හා දිවයින පුරා විසිරි සිටින කර්මාන්තකරුවන්ට අවශ්‍ය පෙල් සාධාරණ මිලකට ලබාගැනිමටත් පොල් වෙන්දේසිය මනා විනිවිදභාවයකින් ක්‍රියාත්මක කර පවතින දූර්වලතා අවම කර ගනිමින් අමාත්‍යාංශයේ උපදෙස් හා මෙහෙයවීම මගින් පොල් සංවර්ධන අධිකාරිය හරහා පොල් වෙන්දේසිය අන්තර්ජාලයට සම්බන්ධ මෙහෙයුම් පද්ධතියක් ලෙස සකස් කරමින් පවති. අන්තර්ජාලයට සම්බන්ධ කිරීම මගින් පොල් වෙන්දේසියෙන් වැඩි ගැණුම්කරුවන් පිරිසක් සඳහා අවස්ථාව ලබාදීමෙන් වඩා ප්‍රශස්ත මිල මට්ටමක් පවත්වාගැනීමට හැකිවේ.

## 9.7 ගුණාත්මක නිෂ්පාදන සිදුකිරිමේ අරමුණින් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන භාවිතයන් (GMP) හඳුන්වා දීම හා ක්‍රියාත්මක කරලීම

පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ප්‍රමිතිකරණය සහ ගුණාත්මකභාවය පවත්වාගැනීම සහ තරඟකාරීත්වයෙන් යුත් යහපත් නිෂ්පාදන වෙළඳපොල වෙත හඳුන්වා දිම මූලික අභිප්‍රාය කරගනිමින් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය පොල් සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ඒකාබද්ධව යහපත් නිෂ්පාදය භාවිතයන් (GMP) හඳුන්වා දී ඇත.
මෙම වැඩසටහන යටතේ 2013.12.31 දිනට අත්කරගත් ප්‍රගතිය පහත පරිදි වේ.

| | නිෂ්පාදනය/ සේවාව | ලැබුණු අයදුම්පත් ගණන | විගණනය 1 | විගණනය 2 | නිකුත් කළ සහතික පත් ගණන |
|---|---|---|---|---|---|
| 1 | දිසඳි පොල් | 47 | 40 | 30 | 26 |
| 2 | පොල් කිරි මේදය තරමක් ඉවත් කළ/ දිසඳි පොල් | 2 | 0 | 0 | 0 |
| 3 | පොල් තෙල් කොප්පරා | 8 | 0 | 0 | 0 |
| 4 | කොහු කෙඳි අගය වැඩිකළ කොහු බත් | 11 | 1 | 1 | 0 |
| එකතුව | | 68 | 41 | 31 | 26 |

## 9.8 පිටි කල පොල් කිරි ප්‍රවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාව තුළ පොල් ගෙඩි වැඩි ප්‍රමාණයක් භාවිතා වන්නේ ඉහළ ආදායමක් ලබාගත හැකි කර්මාන්ත සඳහා නොව එදිනෙදා පාරිභෝජනය සඳහා වේ. මෙයිනුත් පොල් කිරි ලබාගැනිමට යොදා ගන්නා මදයෙන් 35% ක් අපතේ යයි. ගෘහස්ත පරිභෝජනයේදි ආකාර්යක්ෂම පොල් භාවිතය හේතුවෙන් ප්‍රයෝජනයට ගත හැකි පොල් මදයේ යම් කොටසකුත් පොල් ගෙඩියේ අනෙකුත් කොටසුත් මෙලෙස අපතේ යාම නිසා කර්මාන්ත සඳහා අවශ්‍ය පොල් ප්‍රමාණය සපුරා ගැනිම ගැටළුවක්ව පවති.

පිටි කළ පොල් කිරි ප්‍රවර්ධන වැඩසටහන තුළින් පොල් ගෙඩිය කර්මාන්ත හා පාරිභෝජන අවශ්‍යතා සඳහා උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම අපේක්ෂා කෙරේ.

## 9.9 ප්‍රශස්ත මට්ටමේ ඉඩම් උපයෝගීකරණය සහ ඵලදායිතාව ඉහල නැංවීම

ඉතා සීමිත සම්පතක් වන ඉඩම් ප්‍රශස්ත මට්මකින් භාවිතා කිරීමේ අභිප්‍රායෙන් පොල් ගසේ විවිධ කාල පරාසයන් වලදි විවිධ භෝග වර්ග අතුරු භෝග ලෙස වගා කල හැකිය. කොකෝවා, රඹුටන්, අඹ, පේර. දෙළුම්, කුරුඳු, පුවක්, අලිගැටපේර, කජු, ගම්මිරිස්, අන්නාසි, කෙසෙල්, ගස්ලබු, ඉඟුරු, කහ, මඤ්ඤොක්කා වැනි බහු වාර්ෂික හා ද්විවාර්ෂික හා ඒක වාර්ෂික භෝග වර්ග අතුරු භෝග ලෙස වගා කළ හැකිය. පොල් වගා කිරිමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, හලාවත වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම මඟින් පාලනය වන වතු වල මේ වන විට සාර්ථකව අතුරු භෝග වගාව සිදු කෙරෙමින් පවති.

## 9.10 ආදර්ශ වතු සංවර්ධනය

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති පොල් වතු මනා කළමණාකාරීත්වයකින් යුතුව පාලනය කිරීමෙන් වැඩි ඵලදාවක් ලබා ගැනීමේ පරමාර්ථය මූලික කර ගනිමින් ගරු ඇමතිතුමාගේ සංකල්පනාවක් මත ලේකම්තුමාගේ උපදේශයෙන් ආදර්ශ වතු සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වේ.

**පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ වතු**

1. ලේනව ආදර්ශ පොල් උයන
2. ඬේසිවැලි ආදර්ශ පොල් උයන
3. නාගන්සෝල ආදර්ශ පොල් උයන
4. රන්දෙනිය ආර පොල් උයන

**පොල් පර්යේෂණ ආයතනයට අයත් ආදර්ශ වතු**

1. මාකඳුර ජාන සම්පත් මධ්‍යස්ථානය
2. තබ්බෝව වත්ත
3. පොත්තුකුලම පර්යේෂණ මධ්‍යස්ථානය

**කුරුණෑගල වැවිලි සමාගමට අයත් ආදර්ශ වතු**

1. දොඩම්ගස්ලන්ද වතු යායේ දොඩම්ගස්ලන්ද බෙදුම
2. දොඩම්ගස්ලන්ද වතු යායේ පානගමුව බෙදුම
3. හිරයාල පළාත් වතු යායේ ගනේවත්ත බෙදුම

**හලාවත වැවිලි සමාගමට අයත් ආදර්ශ වතු**

1. බිංගිරිය වතු කොට්ඨාශය
2. පලුගස්වැව වතු කොට්ඨාශය
3. දිවුලපිටිය වතු කොට්ඨාශය

# 10. අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් අඛණ්ඩව ක්‍රියාත්මක වන විශේෂ සංවර්ධන වැඩසටහන්

## 10.1 කප්රුක පුරුවර වැඩසටහන

පොල් වගා කිරීම හා සුළු හා මධ්‍ය පරිමාණ පොල් ආශ්‍රිත කර්මාන්ත වෙත ප්‍රජාව යොමු කිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් හා ප්‍රජා මූල සංවිධාන ලෙස ඔවුන් සංවිධාන ගත කර ඒ තුළින් පොල් ගස පාදක කරගත් රැකියා අවස්ථා උත්පාදනය කර දිළිඳුභාවය පිටු දැකිම සඳහා 2011 වසරේ දී සිට කප්රුක පුරවර වැඩසටහන ක්‍රියාත්මක වේ.

කප්රුක අරමුදල් පනත යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර 2016 වන විට දිවයිනේ පවතින සියළුම දිස්ත්‍රික්කවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 180 ක් ආවරණය කිරීමට සැලසුම් කර ඇත. කප්රුක පුරවර වැඩසටහන යටතේ 2013 වර්ෂය තුළ මේ දක්වා ප්‍රාථමික සමිති 2669 ක්ද , කලාප සමිති 192 ක්ද පිහිටුවා ඇත.



**10.1** ගරු ඇමතිතුමා විසින් කප්රුක පුරවරයක් ස්ථාපිත කිරීමේ අවස්ථාවක්

## 10.2 කප්රුකයි සිප්ණැනයි වැඩසටහන

2011 වසරේදි ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි හයවන වසරේ ඉගෙනුම ලබන සිසුන් වෙත තම ගෙවත්තේ වගාකිරීම සඳහා පොලි බෑග් පැළ 1-2 ප්‍රමාණයක් නොමිලේ ලබා දෙන ලදී.

පාසල් සිසුන්ට පොල් වගාව පිළිබඳ උනන්දුවක් ඇති කිරීමත්, ගෙවත්තේ පොල් පැළයක් සිටුවීම තුළින් හා එය මනාව රැක බලා ගැනීම තුළින් ආකල්පමය වර්ධනයක් ඇති කිරිමත් එමඟින් ඔවුන්ගේ දෙමාව්පියනටද පොල් වගාව පිළිබඳ උනන්දුවක් ඇති කිරීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය විය. වසර 5 කට පසු සාර්ථකව පොල් පැළ නඩත්තු කළ සිසු සිසුවියන් සඳහා දිස්ත්‍රික්ක මට්ටමේ තේරීමකට ලක්කර උසස් පෙළ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්වයක් පිරිනැමේ.

පාසල් ළමුන් දායක කර ගෙන ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන ආසියානු පැසිපික් පොල් ප්‍රජා ජාත්‍යන්තර සමුළුවේ දී විශේෂ ඇගයීමකටද ලක්විය.2013වර්ෂය අවසන් වන විට මෙම වැඩසටහන යටතේ පාසල් සිසුන්173,721 කට පොල් පැළ 341,407 නිකුත් කිරීම සිදු කර ඇත.



**10.2** කප් රුකයි සිප්නැණයි වැඩසටහන යටතේ ගරු අමාත්‍යතුමා විසින් 6 වසර ශිෂ්‍යාවකට පොල් පැළ බෙදා දෙමින්

### 10.3 වැලිගම රෝග මර්ධන වැඩසටහන

දකුණු ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතින වැලිගම කොළ මැලවීම හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ , පොල් වගාකිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනය ඒකාබද්ධව සිදු කරයි.

ගාල්ල දිස්ත්‍රික්කයේ රෝගී ගස් ලකුණු කිරීම, රෝගී ගස් ඉවත් කිරීම හා වන්දි මුදල් ගෙවීමද මාතර දිස්ත්‍රික්කයේ රෝගී ගස් සලකුණු කිරීම හා ඉවත් කිරීමද පොල් වගා කිරීමේ මණ්ඩලයේ නිළධාරීන් විසින් සිදු කරනු ලබන ලබන අතර දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වන්දි මුදල් ගෙවීම සිදුකරනු ලබයි. මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කය රෝගී මුක්ත කලාපයක් බවට පොල් පර්යේෂණ ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇත. එක් රෝගී ගසක් ඉවත් කිරීම වෙනුවෙන් රු 2000/- ක උපරිමයකට යටත්ව වන්දි මුදල් පිරිනැමේ.

### 10.4 ජාලගත දත්ත පද්ධතිය

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති පොල් වතු මනා කළමණාකාරිත්වයෙන් යුතුව ඉහළ ඵලදායිතාවයක් ලබා ගැනිම සඳහා ගරු අමාත්‍යතුමාගේ සංකල්පනාවකට අනුව ලේකම්තුමාගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ 2012 වර්ෂයේ අතිගරු ජනාධිපතිතුමා විසින් මෙම ජාලගත මෙහෙයුම් පද්ධතිය විවෘත කරන ලදී.

මෙය අමාත්‍යාංශය යටතේ ඇති සෑම පොල් වත්තකම එදිනෙදා කඩන හා වැටෙන පොල් ප්‍රමාණය, දෛනිකව සේවකයින්ගේ පැමිණීම හා පිටවීම ඇතුළත් දත්ත පද්ධතියක් වේ. මෙමගින් දිනපතාම පෙරවරු 9.00 වනවිට ගරු අමාත්‍යතුමාගේ හා ලේකම්තුමාගේ ජංගම දුරකතන වෙත ඊමේල් පණිවිඩ ලබා දීම මඟින් සමස්ථ වතු පද්ධතිය අධීක්ෂණය සිදු කරයි.

### 10.5 කප්රුක පුවත්පත් අතිරේකය

පොල් ප්‍රජාව වෙත ව්‍යාප්ති හා කර්මාන්ත තොරතුරු මෙන්ම ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ තොරතුරු ලබාදෙමින් පොල් ප්‍රජාව හා අමාත්‍යාංශය අතර සන්නිවේදන මාධ්‍යක් ලෙස අමාත්‍යාංශයේ නිල පුවත්පත වන ''කප්රුක'' අතිරේකය දිනමිණ, ඩේලිනිව්ස් හා තිණකරන් පුවත්පත් සමඟ 2012 සිට අඛණ්ඩව සෑම මසකම දෙවන සිකුරාදා දින ප්‍රකාශයට පත්කර ඇත. 2013 වර්ෂයේ කප්රුක අතිරේක 12ක් නිකුත් කර ඇත.

### 10.6 පොල් නව/නැවත/යටි වගා සහනාධාරය

මෙම වැඩසටහන යටතේ අක්කර ¼ සිට අක්කර 5 දක්වා වූ ඉඩම්වල පොල් වගාකිරීමට මෙම සහනාධාරය ලබා දෙන අතර ඒ යටතේ වගාකරුවන්ට අවශ්‍ය පොල් පැළ නොමිලේ ලබා දේ. මෙම සහනාධාර ක්‍රමය ප්‍රධාන වශයෙන් කොටස් 3 කට බෙදේ.

I. නැවත වගාව - දැනටමත් පොල් වගාව පවතින එහෙත් වයස්ගත වීම නිසා ඵලදායීතාවය හීන වූ ඉඩම්වල පැරණි වගාව සම්පූර්ණයෙන් ඉවත් කර අලුතින් පොල් පැළ සිටුවා සංවර්ධනය කිරීම.

II. යටි වගාව - දැනටමත් පොල් වගාව පවතින එහෙත් වයස්ගත හෝ ඵලදායිතාවය හීන වූ තවදුරටත් ඵලදායී නොවන ඉඩම්වල පවතින පොල් වගාව අතර ක්‍රමානුකූලව පේළි ලෙස පොල් පැළ සිටුවා සංවර්ධනය කිරීම

III. නව වගාව - පොල් වගාවට සුදුසු එහෙත් වෙනත් වගාවකට හෝ දැනට කැලෑව පවතින ඉඩම්වල පොල් පැළ අලුතින් සිටුවා සංවර්ධනය කිරීම.

2013 වර්ෂය වන විට මෙම වැඩසටහන යටතේ පොල් අක්කර 23,644 වගාකර ඇති අතර වගාකරුවන් 5200 කට පොල් පැළ 2,169,149 නිකුත් කර ඇත.



**10.3 අන්නාසි යටි වගාවක්**

### 10.7 දිවිනැගුම වැඩසටහන

ශ්‍රී ලංකාවේ ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂයක් නඟා සිටුවා එම ගෘහ ඒකක ස්වයංපෝෂිත කරමින් රට සංවර්ධනය කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් දියත් කරන ලද පැළ වගාකිරීමේ වැඩසටහනට පොල් වගාකිරීමේ මණ්ඩලය ඉහළ දායකත්වයක් ලබා දෙන ලදී.

පොල් පැළ ප්‍රාදේශිය කාර්යාලය දක්වා ප්‍රවාහනය හා පොල් පැළ සිටුවීම හා රැකබලා ගැනීම සම්බන්ධව දැනුවත් කිරීමේ කාර්යය පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් සිදු කරන ලදී.2013 වර්ෂයේදී දිවිනැගුම වැඩසටහන යටතේ පොල් පැළ 2,723,803 ක් නිකුත් කර ඇත.

### 10.8 පූජා භූමි පොල් වගා වැඩසටහන

2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති වැඩසටහනට සමගාමීව ශ්‍රී ලංකාවේ සියළුම බෞද්ධ විහාරස්ථානවල පොල් පැල සිටුවීමේ වැඩසටහනක් 2011 වසරේදී ක්‍රියාත්මක කෙරුණු අතර 2012 වසරේ සිට ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාරස්ථානවල මෙන්ම අනිකුත් ආගමික සිද්ධස්ථාන වල ද පොල් වගා කිරීම සඳහා පූජා භූමි වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව පන්සල්,පල්ලි සහ කෝවිල් වැනි පූජා භූමිවල පවත්නා ඉඩ ප්‍රමාණය අනුව එක් ස්ථානයක් සඳහා පොල් පැළ 1 සිට 10 ක ප්‍රමාණයක් නොමිලේ නිකුත් කෙරේ. 2013 වර්ෂාවසානය වන විට මෙම වැඩසටහන යටතේ පොල් පැළ 27,662 ක් නිකුත් කර ඇත

### 10.9 කප්රුක ආයෝජණ ණය වැඩසටහන

යැපීම් මට්ටමේ පොල් වගාකරුවකු වාණිජ මට්ටමේ පොල් වගාකරුවකු බවට පත්කිරීමේ මූලික අරමුණින් මෙම වැඩසටහන ආරම්භ කරන ලද අතර මෙමඟින් සහනාධාර ක්‍රම වලට හුරු වී සිටි පොල් වගාකරුවන් ක්‍රමයෙන් එයින් ඉවත් කර තම පොල් ඉඩම උපරිම ඵලදායිතාවයෙන් යුතුව සංවර්ධන කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ණය වශයෙන් ලබා දීම සැලසුම් කරන ලදී. පොල් වගාකිරීමේ මණ්ඩලය සමඟ පුද්ගලික හා රාජ්‍ය බැංකු 10 ක් එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. ණය ලබා ගත් වගාකරුවන් ඵලදායි ලෙස හා එකඟ වූ ව්‍යාපෘතිවලට අනුව යොදවන්නේ ද යන්න පිළිබඳ පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිළධාරියෙකු විසින් නිරතුරුව පරීක්ෂා කරනු ලැබේ.

මෙම ණය ක්‍රමය යටතේ සාපේක්ෂව ඉතාමත් අඩු පොළියකට වගාකරුවන්ට ණය ලබා දෙන අතර සෑම වසරක් අවසානයේදී ම වගාකරුවන්ට පොළි සහන ලබා දීම තුළින් මෙම පොලි ප්‍රතිශතය තවදුරටත් අඩු කර ඇත. ඒ අනුව කප්රුක ණය ආයෝජණ වැඩ සටහනේ සඵල පොළි අනුපාතය 3.5 - 4% අතර අගයක් ගනු ලැබේ.

පොල් වගාව, අතුරු බෝග වගාව, සත්ත්ව පාලනය, වාරි ජල සම්පාදනය, ගොවිපළ යාන්ත්‍රික උපකරණ මිළදී ගැනීම යනාදී ප්‍රධාන ව්‍යාපෘති 11 කට මේ මඟින් ණය පහසුකම් ලබා ගත හැක.2013 වර්ෂයේ මෙම වැඩසටහන යටතේ පොල් අක්කර 1535 සංවර්ධන කිරීම සඳහා රු.මිලියන 59.46 ණය වශයෙන් ලබා දී ඇත.

## 10.10 පුනරුත්ථාපන වැඩසටහන

දිවයිනේ පවතින බොහෝ පොල් ඉඩම්වල අක්කරයකට පවතින පොල් ගස්/පැළ ප්‍රමාණය 40 – 50 පමණ වේ. පොල් වගාවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා සිටුවීමට අක්කරයකට උපරිම වශයෙන් පැළ 24 ක් වන ලෙස නොමිලේ පැළ නිකුත් කෙරේ. වසරකට එක් පුද්ගලයකු සඳහා පොල් පැළ 12 සිට උපරිම වශයෙන් 320 දක්වා නිකුත් කෙරේ. 2013වර්ෂයේ මෙම වැඩසටහන යටතේ පොල් පැළ 198,268 ක් නිකුත් කර ඇත.

## 10.11 පොල් ආශ්‍රිත කර්මාන්ත ඇරඹීම/ පවත්නා කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම

ග්‍රාමීයව සුලභව පවත්නා අපතේ යන පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය භාවිත කරමින් පොල් ආශ්‍රිත ගෘහ කර්මාන්ත සිදු කිරීම, එක් එක් ප්‍රදේශයන්හි පාරම්පරිකව සිදු කරන පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම, පොල් ආශ්‍රිත අත්කම් හා විසිතුරු නිෂ්පාදන සිදුකිරීම යනාදියට ප්‍රායෝගික පුහුණු වැඩසටහන්, වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තවද එම නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳන්වාදීම, වෙළඳපොල නිෂ්පාදන ඉල්ලුම පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී. 2013.12.31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 32 තුළ පොල් ආශ්‍රිත ගෘහ කර්මාන්ත සිදු කිරීම සඳහා පුහුණු වැඩසටහන් 73 ක් පවත්වා ඇති අතර මෙමගින් ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් ගණන 2017 පමණ වේ.



**10.4** පොල් ආශ්‍රිත නිෂ්පාදන වැඩසටහනක අවස්ථාවක්

## 10.12 පොල් කටු හා පොල් ලෙලි එක් රැස් කර කර්මාන්තයට යොමු කිරිම

ප්‍රයෝජනයට නොගෙන අපතේ යන පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය හඳුනාගනිමින් කර්මාන්තය සඳහා යොදවා ගැනිමේ අරමුණින් පොල් කටු හා පොල් ලෙලි එක් රැස් කිරිමේ මධ්‍යස්ථාන පිහිටුවිම සඳහා කටයුතු කරන ලදී. 2012 වර්ෂයේ පොල් කටු එක් රැස්කිරිමේ මධ්‍යස්ථාන 47 ක් හා පොල් ලෙලි එක් රැස්කිරිමේ මධ්‍යස්ථාන 14 ක් ස්ථාපනය කිරීමට කටයුතු කරන ලද අතර මෙම වර්ෂයේ අවසානය වන විට පොල් කටු එක්රැස් කිරිමේ නව මධ්‍යස්ථාන 30 ක් හා පොල් ලෙලි එක්රැස් කිරිමේ මධ්‍යස්ථාන 4 ස්ථාපනය කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේ පොල් ලෙලි 667,600 එක් රැස්කර, අගය වැඩි නිෂ්පාදන සඳහා කි.ග්‍රෑ. 161,075 යොදා ගන්නා ලදි. පොල් කටු කි.ග්‍රෑ. 766,890 ක් එක්රැස්කර පොල්කටු අඟුරු කි.ග්‍රෑ. 164,535ක් නිෂ්පාදනය කරන ලද අතර පොල් කටු ආශ්‍රිත අගය වැඩි කර්මාන්ත සඳහා යොදාගැනිමට පොල් කටු කි.ග්‍රෑ. 132,555ක් අලෙවි කරන ලදී.

## 10.13 කප්රුක නිපයුම් දිරිය සහන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය/නවිකරණය හා නව කර්මාන්ත ඇරඹීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සපුරා ගැනීමට සහය වීමේ අරමුණින් පොල් සංවර්ධන අධිකාරිය මහජන බැංකුව හා එක්ව වාර්ෂිකව 6% සහන පොළී පදනම මත රු. මිලියන 2.0 ක උපරිමකට යටත්ව මුල්‍ය සහන ලබා දීමට කටයුතු කරන ලදී.

## 10.14 සාම්ප්‍රදායිකව පොල් වගා නොකරන ප්‍රදේශ වල පොල් වගාව සඳහා පාංශු යෝග්‍යතාව ඇගයීම

මොණරාගල, අනුරාධපුර, පොළොන්නරුව, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, මන්නාරම හා යාපනය දිස්ත්‍රික්ක වල පාංශු සමීක්ෂණ ආරම්භ කරන ලදී. මොණරාගල දිස්ත්‍රික්කයේ සමීක්ෂණය නිම කර ඇති අතර ප්‍රධාන පාංශු කාණ්ඩ 8 කට අයත් පාංශු වර්ග 33 ක් හඳුනා ගැනීමට හැකිවී ඇත. මෙම පාංශු වර්ග තුල **S1** (වසරකට හෙක්ටයාරයකට ගෙඩි 15,000 ට වැඩි ඵලදායීතාව ඇති) කාණ්ඩයේ පාංශු වර්ග නොමැති අතර **S2** (වසරකට හෙක්ටයාරයකට ගෙඩි 12,500 – 15,000 අතර ඵලදායීතාව ඇති) කාණ්ඩයේ හෙක්ටයාර 17,000 ක් හඳුනා ගැනීමට හැකිවිය. **S3** (වසරකට හෙක්ටයාරයකට ගෙඩි 10,000 – 12,500 අතර ඵලදායීතාව ඇති) කාණ්ඩයේ හෙක්ටයාර 90,000 ක්, **S4** කාණ්ඩයේ හෙක්ටයාර 116,000 ක් හා **S5** කාණ්ඩයේ හෙක්ටයාර 28,300 ක් හඳුනා ගැනිණ. ඉතිරි ඉඩම් පොල් වගාවට නුසුදුසු ඉඩම් විය. මෙම සමීක්ෂණයේ වාර්තාව මෙම ප්‍රදේශයේ පොල් වගාවට උනන්දුවක් දක්වන වගාකරුවන්ට ලබාදීමට නියමිතය. මෙම පාංශු සමීක්ෂණ වාර්තා පොල් වගාවෙන් මෙන්ම වෙනත් වගාවන්ගෙන්ද ඉහළ ඵලදායීතාවක් ලබා ගැනීමට ඉතා වැදගත් තොරතුරු ඉදිරිපත් කරයි. පාංශු යෝග්‍යතාව අනුව වගා කල හැකි පොල් ප්‍රභේද මෙන්ම අනුගමනය කල යුතු තාක්ෂණ ක්‍රම වගාකරුවන්ට තීරණය කල හැක.

# 11. අමාත්‍යාංශයේ පරිපාලනය සහ ගිණුම්කරණය

## 11.1අමාත්‍යාංශයේ තනතුරු හා කාර්යමණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | සම්පූර්ණ වී ඇති සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ලේකම් | 1 | 1 | - |
| අතිරේක ලේකම් | 2 | 1 | 1 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | 1 | - |
| අධ්‍යක්ෂ | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරි | 1 | 1 | - |
| සහකාර ලේකම් | 2 | 1 | 1 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන සේවය) | 2 | - | 2 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම් සේවය) | 1 | - | 1 |
| සහකාර අධ්‍යක්ෂ | 2 | 2 | - |
| ගණකාධිකාරී | 1 | 1 | - |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | |
| පරිපාලන නිලධාරි | 1 | 1 | - |
| භාෂා පරිවර්ථක | 2 | - | 2 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 1 | - | 1 |
| සංවර්ධන සහකාර | 10 | 3 | 7 |
| සංවර්ධනනිලධාරී | 733 | 436 | 297 |
| කළමණාකරණ සහකාර | 18 | 9 | 9 |
| රියදුරන් | 10 | 8 | 2 |
| කාර්යාල කාර්යය සහයක | 10 | 09 | 1 |

**11.1** වගුව  අමාත්‍යාංශයේ තනතුරු හා කාර්යමණ්ඩලය

## 11.2 අමාත්‍යාංශයේ පරිපාලනය

අමාත්‍යාංශයේ පරිපාලනය යටතේ ප්‍රධාන වශයෙන් පහත කාර්යයන් සිදු කෙරේ.

1. එදිනෙදා සිදු කල යුතු පරිපාලන හා නඩත්තු කටයුතු
2. මහජන පෙත්සම්, පැමිණිලි, හා අභියාචනා සඳහා කටයුතු කිරීම
3. වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම

4. අමාත්‍යාංශයට අයත් ආයතන වල බඳවාගැනීම්, පත්කිරීම්, ස්ථානමාරු කිරීම්, සේවය දීර්ඝ කිරීම් සහ සේවක ගැටලු ඇතුළු ආයතනයන්හි සියළු පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.
5. පාර්ලිමේන්තුව සම්බන්ධ සියළු කටයුතු
6. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබෙන ලිපි සම්බන්ධව සියළු කටයුතු
7. දේශිය හා විදේශිය නිවාඩු සම්බන්ධ සියළු කටයුතු
8. චක්‍රලේඛ සම්බන්ධ සියළු කටයුතු
9. උපාධිධාරීන් බඳවාගැනීමේ වැඩසටහන යටතේ සියළු බඳවා ගැනීම්, මාරුකිරීම්, විනය ක්‍රියාමාර්ග ඇතුළු සියළු කටයුතු
10. අමාත්‍යාංශ නිලධාරීන්ගේ පුහුණුවීම් සම්බන්ධ සියළු කටයුතු

## 2013 වර්ෂයේ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්

1. 2013 වර්ෂයේ මාර්තු මස 07 වන දින පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය 493/1 මහවැලි අධිකාරියට අයත් ගොඩනැගිල්ලේ සිට බත්තරමුල්ල පිහිටි සෙත්සිරිපාය දෙවන අදියරේ 8වන මහල වෙත ගෙන ඒම සහ අමාත්‍යාංශය එම ගොඩනැගිල්ලේ පිහිටුවීම.
2. විවිධ ආයතන මගින් ඉදිරිපත් කෙරෙන ලිපි වලින් අදාල ඉල්ලුම්කරුවන්ට සුදුසු සහන නොපමාව ලබාදීමට කටයුතු කරනු ලැබු අතර වඩාත් සංකීර්ණ කරුණු වලදී ආයතන වලින් වාර්තා කැදවා යෝග්‍ය පරිදි සහන ලබා දීමට පියවර ගෙන ඇත. 2013 වර්ෂයේදි ලැබී ඇති සියළු ලිපි සඳහා කටයුතු කර ඇත.
3. පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් අඛණ්ඩව පවත්වා ඇති අතර එහිදී ඉදිරිපත් වූ යෝජනා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම.
4. අමාත්‍යාංශයට අයත් ආයතන වල හා අමාත්‍යාංශයේ බඳවාගැනීම්, පත්කිරීම්, ස්ථානමාරු කිරීම්, සේවය දීර්ඝ කිරීම් සහ සේවක ගැටලු සඳහා කටයුතු කර ඇත. එහිදි පහත ආකාරයෙන් අමාත්‍යාංශය වෙත බඳවා ගැනීම් හා මාරුවීම් සිදුකර ඇත.මෙම අමාත්‍යාංශයෙන් 2013 වර්ෂයේ එක් කළමණාකරණ සහකාරවරියක ඉල්ලා අස් වී ඇත.

- කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වීම

| දිනය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 2013.10.02 | සහකාර අධ්‍යක්ෂ(නව පත්වීම්) | 01 |
| 2013.04.12 | ජ්‍යෙෂ්ට සහකාර ලේකම් | 01 |
| | කාර්යාල කාර්ය සහායක | 02 |

11.2වගුව බඳවාගැනීම් සහ අමාත්‍යාංශය වෙත ස්ථාන මාරුවීම්

2013 වර්ෂයේ දී මෙම අමාත්‍යාංශ වෙත උපාධිධාරීන් 398 දෙනෙකු බඳවා ගත් අතර අමාත්‍යාංශයෙන් උපාධිධාරීන් 06 දෙනෙකු ස්ථාන මාරුවී ඇත.

- අමාත්‍යාංශ නිලධාරීන් වෙනත් ආයතන වෙත ස්ථාන මාරු වීම

| දිනය | තනතුර | ස්ථානය |
|---|---|---|
| 2013.04.10 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්) | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය |
| 2013.03.11 | කාර්යාල කාර්ය සහායක | බඩල්කුඹුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| 2013.06.03 | කාර්යාල කාර්ය සහායක | තැපැල් අමාත්‍යාංශය |
| 2013.06.13 | රියදුරු | තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| 2013.07.17 | කාර්යාල කාර්ය සහායක | ලාහුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| 2013.12.06 | රියදුරු | නැවත පදිංචි කිරීමේ අමාතයාංශය |

**11.3** අමාත්‍යාංශ නිළධාරීන් වෙනත් ආයතන වෙත ස්ථාන මාරුවීම්

2013 වර්ෂයේ අමාත්‍යාංශයේ කිසිදු නිළධාරියකු විශ්‍රාම ගෙස් නැත.

5. අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි පහත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

| ආයතනය | වර්ෂය |
|---|---|
| සීමාසහිත හලාවත වැවිලි සමාගම | 2010, 2011,2012 |
| පොල් පර්යේෂණ ආයතනය | 2010,2011 |
| පොල් වගා කිරීමේ මණ්ඩලය | 2011 |
| සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 2012 |
| පොල් සංවර්ධන අධිකාරිය | 2011,2012 |

11.4 අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා

## 11.3 අමාත්‍යාංශයේ ගිණුම්කරණය

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ගිණුම් අංශය ප්‍රධාන ගණකාධිකාරවරයකු සහ ගණකාධිකාරිනියකගෙන් සමන්විතය. ඒ යටතේ කළමනාකරණ සහකාර සේවයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ හතර දෙනෙකු සේවය කරයි. ඊට අමතර වශයෙන් කා.කා.ස. ලෙස එක් අයෙකු සේවය කරයි. එසේම සංවර්ධන නිලධාරීන් තිදෙනෙකු සේවය කරයි.

මෙම අමාත්‍යාංශයට අදාළ ශීර්ෂ අංක 178 යටතේ 2013 වර්ෂයේ කරන ලද වියදම්වල සාරාංශය පහත පරිදි වේ.

**01.** **අමාත්‍ය කාර්යාලය (පුනරාවර්තන වියදම්)**

රු. '000

| වැය විෂය අංකය | විස්තරය | මුළු ප්‍රතිපාදන | සත්‍ය වියදම |
|---|---|---|---|
| | පුද්ගල පඩිනඩි | 9,660 | 9,654 |
| | අනෙකුත් වියදම් | 18,970 | 18,760 |

**අමාත්‍ය කාර්යාලය (මූලධන වියදම්)**

| | ප්‍රාග්ධන භාණ්ඩ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | | |
|---|---|---|---|
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 6,960 | 6,955 |
| 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 1,400 | 1,379 |
| 2003 | වාහන | 2,050 | 2,037 |

| | | | |
|---|---|---|---|
| | <u>ප්‍රාග්ධන භාණ්ඩ අත්පත් කරගැනීම.</u> | | |
| 2101 | වාහන | 8,962 | 8962 |
| 2102 | ලී බඩු හා කාර්යාල උපකරණ | 2,670 | 2661 |
| 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 150 | - |

**02.** <u>අමාත්‍යාංශ කාර්යාලය (පුනරාවර්තන වියදම්)</u>

| | | | |
|---|---|---|---|
| | පුද්ගල පඩිනඩි | 60,744 | 60,628 |
| | අනෙකුත් වියදම් | 49,724 | 49,338 |

| <u>වැය විෂය අංකය</u> | <u>විස්තරය</u> | <u>මුළු ප්‍රතිපාදන</u> | <u>සත්‍ය වියදම</u> |
|---|---|---|---|
| <u>අමාත්‍යාංශ කාර්යාලය (ප්‍රාග්ධන වියදම්)</u> | | | |
| | <u>ප්‍රාග්ධන භාණ්ඩ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්</u> | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 10,570 | 10,566 |
| 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 500 | 500 |
| 2003 | වාහන | 1,700 | 1,294 |
| | <u>ප්‍රාග්ධන භාණ්ඩ අත්පත් කරගැනීම.</u> | | |
| 2101 | වාහන | 6,130 | 6,129 |
| 2102 | ලී බඩු හා කාර්යාල උපකරණ | 1,600 | 1,597 |
| 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 350 | - |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 450 | 441 |

මෙම වියදම් දැරීම සඳහා භාණ්ඩාගාරයෙන් ශීර්ෂ අංක 178 යටතේ ලද මුළු අග්‍රිම ප්‍රමාණය රු. 206,480,000 කි. 2013 වර්ෂය සඳහා සත්‍ය වශයෙන් ලද ආදායම පහත පරිදි වේ.

| <u>ආදායම් ශීර්ෂ සංකේතාංකය</u> | <u>විස්තරය</u> | <u>සත්‍ය ආදායම</u> |
|---|---|---|
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | 113,580.00 |
| 20.02.02.99 | පොළිය - වෙනත් | 200,917.19 |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් | 343,912.01 |

මෙම අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| | වියදමේ උපරිම සීමාව | ලැබීම්වල අවම සීමාව | හරශේෂයේ උපරිම සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනත මඟින් බලය දෙන ලැබූ සීමාවන් | 4,000,000.00 | 800,000.00 | 8,000,000.00 |
| වර්ෂය තුළ ප්‍රතිශෝධිත සීමාවන් | | | |
| 1 නියෝග අංක | | | |
| වර්ෂය අවසානයේ තත්‍ය අගයන් | 2,957,304.17 | 1,142,388.64 | 5,824,870.75 |
| (මු.රෙ 503 (i) යටතේ ගැලපුම් | 1,006,463.00 | 732,311.00 | - |
| | 3,963,767.17 | 1,874,699.64 | 5,824,870.75 |

## 11.4 2013 වර්ෂයේ පොදු ව්‍යාපාර කාරක සභා

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සහ සීමාසහිත හලාවත වැවිලි සමාගම සඳහා 2013 වර්ෂයේ මාර්තු මාසයේදි පොදු ව්‍යාපාර කාරක සභාව පවත්වන ලදී. එහිදි එම සමාගම් දෙක 2012 වර්ෂය සඳහා වඩා හොඳ ප්‍රගතියක් අත්කර ගැනීම පිළිබඳ පොදු ව්‍යාපාර කාරක සභාව විසින් එම සමාගම් දෙක සඳහා ප්‍රශංසා කරන ලදී.

## 11.5 අමාත්‍යාංශයේ විගණනය

2013 වර්ෂය තුළ අමාත්‍යාංශය මඟින් කළමණාකරණ විගණන කමිටු 04ක් පවත්වා ඇත.

2013 වර්ෂයට සම්බන්ධව විගණන විමසුම් දාහතරක් (14) ලැබී ඇති අතර එම විගණන විමසුම් දාහතර (14) සඳහාම පිළිතුරු සපයා ඇත.